**ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 30 දින මැනුම්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,267.33 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,198.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 68.71 ක් හෙවත් සියයට 2.10 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 3,026.03 | 2,966.92 | 59.11 | 1.95 |
| මූලධන | 241.30 | 231.70 | 9.60 | 3.98 |
| **එකතුව** | **3,267.33** | **3,198.62** | **68.71** | **2.10** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

බිම් සවිය වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 277 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 254 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 23 ක් හෙවත් සියයට 8 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 20-03-02-04 සඳහා එකතුව රු.මිලියන 101 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 308 ක් ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 305 ක් වී තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 157.33 | 110.97 | 107.33 | 123.34 | 380.00 | 317.76 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0044/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 2.34 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 10.55 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 000/0117/0002/00/0000/6000 | 1.70 |
| 000/0077/0013/00/0000/6000 | 0.30 |
| 000/0065/0016/00/0000/6000 | 8.59 |
| 000/0143/0015/00/0000/6000 | 0.06 |
| එකතුව | **10.55** |

## 2.6 විගණන නිරීක්ෂණය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි . |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2** **ආදායම් ගිණුම**

**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.03.02.04 දරන ආදායම් සංකේතයට අදාළව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 140 ක් වී තිබුණි. නමුත් විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 101 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මැනුම් ගාස්තු ආදායම හා තැන්පත් ගිණුමේ ඉදිරියට ගෙන ගිය ශේෂ එකතුව රු.මිලියන 22 කින්, රු. මිලියන 167 ක් පමණක් මැනුම්පති ආදායමට බැර කර තිබුණු අතර වෙනස වූ රු.මිලියන 62 ක වියදම් සඳහා යොදාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී මැනුම් ගාස්තුවලින් සියයට 73 ක් පමණක් ආදායමට බැර කර තිබුණි.

**3.4** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

විෂය අංක 28801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගත් හා මියගිය, සේවය හැරගිය, වැඩ තහනම් කළ සහ වෙනත් ණය ශේෂවල එකතුව රු.7,096,321 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 33 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂය අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) බස්නාහිර පළාත් ගිණුම් සැසඳීමේදී ආරම්භක ශේෂයට "පාලන ගිණුමට අඩුවෙන් සටහන් වී ඇති ණය ශේෂයන් එකතු කිරීම" ලෙස රු. 503,507 ක් එකතු කර පාලන ගිණුම තුලනය කර තිබුණි.

**3.5** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2016 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් 2014 ජූලි 31 දින සිට රු. මිලියන 15 ක් වටිනා මෝටර් රථ 02 ක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවටත්, තවත් වටිනාකම හෙලිදරව් නොවූ මෝටර් රථයක් ඉඩම් අමාත්‍යාංශයටත් අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.

### (ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව | වටිනාකම<br>රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| මෝටර් වාහන | ඉඩම් අමාත්‍යාංශය | 16 | වාහන 05 ක වටිනාකම රු.මිලියන 21 ක් වන අතර වාහන 11 ක වටිනාකම් හෙලිදරව් කර නැත. | 2014 ජූලි 24 දින සිට |
| | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | 04 | හෙලිදරව් කර නැත. | හෙලිදරව් කර නොමැත. |

## 3.7 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී මායිම් ගල් දැමීමේ මැනුම්වල ඉලක්ක කැබලි සංඛ්‍යාව 49,413 ක් වුවද, කාර්යසාධන වාර්තාවට අනුව කැබලි 42,859 ක් පමණක් මැනීම් සිදුකර තිබීමෙන් ප්‍රගතිය සියයට 87 ක් ව පැවතුණි.

(ආ) ඉංජිනේරු මැනුම්වල ඉලක්ක කැබලි සංඛ්‍යාව හෙක්ටයාර 4,180 ක් වුවද, කාර්යසාධන වාර්තාවට අනුව හෙක්ටයාර 1550 ක් පමණක් මැනීම් සිදුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය සියයට 37 ක්ව පැවතුණි.

(ඇ) උසාවි මැනුම් නියෝග ඉලක්ක කැබලි සංඛ්‍යාව 10,200 ක් වුවද කාර්යසාධන වාර්තාවට අනුව කැබලි 7,425 ක් පමණක් මැනීම් සිදුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය සියයට 73 ක්ව පැවතුණි

(ඈ) 2015 දෙසැම්බර් 31 දින වන විට 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඉතිරිව පැවැති මැනුම් නියෝග සංඛ්‍යාව 22,941 ක් වී තිබුණි. පසුගිය වර්ෂ හත තුළ ඉතිරිව පැවැති මැනුම් නියෝග 22,941 ක් සම්පූර්ණ කිරීමට විශේෂ සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පූර්ණමාන (Total Station) මිලදී ගැනීම**

දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 23.36 ක් වැය කර පූර්ණමාන (Total Station) මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) මේ සඳහා ආයතන 06 කින් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඉන් ආයතන 03 ක් විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ප්‍රතික්ෂේප කර තිබුණු අතර එසේ ප්‍රතික්ෂේප කිරිම සඳහා පහත සඳහන් කරුණු පාදක කර ගෙන තිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව බාහිර උපදේශකයෙකුගේ සහාය ලබා නොගෙන ඔප්පු කිරීමේ පරීක්ෂණය (Demonstration) පාදක කර ගැනිම.
- ආධාරක උපකරණවල විවිධ දෝෂ ඇති බව සඳහන් කිරීම හා ප්‍රමිතිකරණ ලද උපකරණවල වෙනස්කම් පැවැතිමත්, එම උපකරණවල වටිනාකම පූර්ණමානයේ වටිනාකමින් සියයට 3 කට අඩු වි තිබීම.
- Dust and water protection අගය 55 ක් වූ පූර්ණමාන දෙපාර්තමේන්තුව විසින් මීට පෙර මිලදීගෙන තිබියදී මෙවර එම අගය 65 ලෙස නිර්දේශ කර තිබිම.
- 4 වන හා 5 වන වසර වෙනුවෙන් නඩත්තු පිරිවැයන් ඉල්ලා තිබූ අතර ලංසුකරුවන් එය ව්‍යාකූල ආකාරයට ඉදිරිපත් කර තිබීම.
- ඇතැම් ලංසුකරුවන් සියළු නඩත්තු ඇතුළුව වර්ෂ 05 ක පූර්ණ වගකීම් සහතිකයක් ලබාදී තිබුණද එම ලංසුද ප්‍රතික්ෂේප කර තිබුණි.
- Keyboard, Alpha Numeric keyboard හෝ Touch panel both faces නොමැති බව සඳහන් කර ඇතැම් ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි.

ඉහත කරුණු පාදක කර ගෙන ඉදිරිපත් කර තිබුණු ලංසු ප්‍රතික්ෂේප කර තිබුණත්, 2016 වර්ෂයේ පූර්ණමාන 25 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම තාක්ෂණික පිරිවිතරය ඉවත් කර තිබුණි. තවද මෙම පිරිවිතරය සම්පූර්ණ නොකළ Trimble වර්ගයේ පූර්ණමාන මීට පෙර දෙපාර්තමේන්තුව මිලට ගෙන තිබුණි.

(ii) උපකරණ මිලදී ගත් කොන්ත්‍රාත්කාර සමාගම විසින් උපකරණ නඩත්තු පිරිවැයක් ලෙස රු.6,048,000 ක් දක්වා තිබුණත්, ලංසු ඇගයීම සඳහා එම පිරිවැය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුව මිලදී ගෙන තිබූ Soccia CX Series වර්ගයේ පූර්ණමාන සහ Topcon ES – 103 වර්ගයේ පූර්ණමානවල පිරිවිතරයන් සියල්ලම එක හා සමාන බව නිරීක්ෂණය විය. වර්ග දෙකක පූර්ණමාන වී තිබුණත්, එහි නිෂ්පාදන සමාගම දෙක එක් සමාගමක අනෙක් සමාගම මව් සමාගම බව නිරීක්ෂණය විය. නමුත් Topcon ES – 103 වර්ගයේ පූර්ණමාන අඩු මිලක් යටතේ ඉදිරිපත් කළද එම ලංසුවද ප්‍රතික්ෂේප කර තිබුණි.

(iv) තෝරාගත් සැපයුම්කරුට අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් කළ තරඟකාරී ආයතන 04 කම මිල ගණන් ඉහත සඳහන් පරිදි පදනම් විරහිත හේතු පාදක කරගෙන ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.3,591,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(v) දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමා සහිත වන විට සහ ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම වාසිදායක බව පෙනී යනවිට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 මාර්ගොපදේශය ප්‍රකාරව ජාත්‍යන්තර වශයෙන් මිල ගණන් කැඳවීමට අවධානය යොමු කළ යුතු වුවද, ඒ සඳහා අවධානය යොමුකර නොතිබුණි.

**(ආ) මිනිසුන් රහිතව ගමන් කළ හැකි කුඩා ප්‍රමාණයේ ගුවන් යානයක් මිලදී ගැනීම (Unman Aerial Vehicle) (U.A.V)**

---

මිනිසුන් රහිතව ගමන් කළ හැකි කුඩා ප්‍රමාණයේ ගුවන් යානයක් රු.8,868,500 ක් වැය කර මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව විසින් මෙවැනි තාක්ෂණයක් භාවිතා කර මැනුම් කටයුතු සිදුකරන ප්‍රථම අවස්ථාව වුවත්, ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ii) පළමු වරට කැඳවන ලද ලංසු පහත සඳහන් කරුණු පදනම් කර ගෙන ප්‍රතික්ෂේප කර තිබුණි.

- පිරිවිතර පිළියෙල කිරීමේදී නිශ්චිතවම අදාළ ගුවන් යානයට තිබිය යුතු තාක්ෂණික ප්‍රමිතීන් නියමාකාරයෙන් නිර්වචනය කර නොතිබීම.
- ඉදිරිපත් කර තිබූ ලංසුවල මිල ගණන්වල විශාල පරතරයන් පැවැතීම.
- ප්‍රසම්පාදනය සඳහා එම විෂය පිළිබඳ තාක්ෂණික විශේෂඥයන් නොවන නිලධාරීන් දෙදෙනෙකු විසින් පිරිවිතර පිළියෙල කර තිබීම.
- තාක්ෂණික ඇගයීම් කමිටුව සහ නිලධාරීන් විසින් එවැනි යානයක් භෞතිකව පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු බවට වූ නිර්දේශය.

- පිරිවිතරවල නඩත්තු කාල සීමාව වසර දෙකක් ලෙස සංශෝධනය කිරීම හා RTK option ඇතුළත් කිරීම.

- ප්‍රතිපාදන සීමාව ඉක්මවීම.

(iii) 2015 ජූලි 16 දින අදාළ ලංසුකාර සමාගම් වෙත නැවත මිල ගණන් එවන ලෙස දැනුම් දී තිබුණි. පළමුවර ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් 04 දෙනෙකු දෙවන වර ලංසු ඉදිරිපත් කර නොතිබුණි. ඒ සඳහා පිරිවිතර වෙනස් කර තිබීම, මසක් තුළ භාණ්ඩ සැපයිය යුතු බව යන නව කොන්දේසියක් පනවා තිබීම, පළමු ලංසු විවෘත කිරීමේදී මිල ගණන් ප්‍රසිද්ධ වීම නිසා සහ රහස්‍යභාවය කඩවීම යන කරුණු ඒ සඳහා බලපා තිබුණි.

(iv) මුල් ලංසු කැඳවීමට අදාළ පිරිවිතරවල අයිතම 09 ක් පමණ වෙනස් කර තිබූ අතර මෙසේ පිරිවිතර වෙනස් කිරීම ඇතැම් ලංසුකරුවන් තරඟයෙන් ඉවත් කිරීමට සහ අධෛර්යමත් කිරීමට හේතුවක් වී තිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශවල ආරම්භයේ සිට අවසානය දක්වා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. පළමුවර මිල ගණන් කැඳවීමේදී ඇණවුම ලැබී මාස 03 ක් තුළ භාණ්ඩ ලබාදිය යුතු බව, දෙවන වර මිල ගණන් කැඳවීමේදී මසක් තුළ භාණ්ඩ ලබාදිය යුතු වශයෙන් වෙනස් කිරීම නිසා ප්‍රමාණවත් කාලයක් නොලැබීමෙන් ලංසුකරුවන් බොහෝමයක් දෙවන වර ලංසු ඉදිරිපත් කර නොතිබුණි. නමුත් භාණ්ඩ මිලදී ගැනීමට තෝරාගත් ලංසුකරුට ඇණවුම් කළ දින සිට භාණ්ඩ ගෙනැවිත් භාරදීම සඳහා මාස 03 ක කාලයක් ලබාදී තිබුණි.

(vi) ඉහත තත්ත්වයන් මත දෙවනවරට තරඟකාරී ආයතන දෙකක් විසින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. තෝරාගත් සැපයුම්කරු සමඟ ඉදිරිපත් කර තිබුණු තරඟකාරී ලංසු දෙකම RTK Option පිරිවිතරය නොමැති බව වාර්තා කර ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම RTK Option පිරිවිතරය දෙවන වර ලංසු කැඳවීමේදී හඳුන්වාදුන් පිරිවිතරයක් වන අතර එම පිරිවිතරය තරඟකාරී ලංසුකරුවන්ට නොමැති බව අනාවරණය වීමෙන් පසු එය පාදක කරගෙන ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.1.(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය විශේෂඥයකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කර නොතිබුණි. තවද 2.8.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවලදී විශේෂඥ උපදෙස් බාහිරව ලබාගත හැකි වුවද ඒ සඳහාද කටයුතු කර නොතිබුණි.

(viii) දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපකරණ සම්බන්ධයෙන් ඉංජිනේරුමය දැනුමකින් යුත් නිලධාරීන් නොමැති නම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ලේඛන කෙටුම්පත් කිරීම සඳහා බාහිර උපදේශකයන්ගේ සහාය ලබාගත හැකි වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ix) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව දේශීය සැපයුම්කරුවන්ගේ සහ සේවා සපයන්නන්ගේ, හැකියාව සීමා සහිත වන විට ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයාබලා නොතිබුණි.

(x) යානය මිලදී ගත් සමාගම, මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගිය මිනින්දෝරුවරයෙකු සහ ඔහුගේ භාර්යාව හා දරුවන් දෙදෙනාට අයිති සමාගමක්

වන අතර, මෙම විශ්‍රාමික මිනින්දෝරුවරයාගේ ඥාති දියණියකද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ මිනින්දෝරු අධිකාරීවරියක ලෙස කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 63 කට ආසන්න වටිනාකමකට සැපයීම් හා සේවා මෙම ආයතනයෙන් මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබුණි. මෙම තත්ත්වය ලබැඳියාවන් අතර ගැටුමක් පැවතීමක් (Conflict of interests) ලෙස දැක්විය හැකිය.

(xi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 1.2 (ඊ) මාර්ගෝපදේශය ප්‍රකාරව ඇගයීමේ හා තේරීමේ කාර්ය පටිපාටියේ විනිවිධභාවය හා නිත්‍යභාවය සහතික විය යුතු අතර, 1.2 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීමට කටයුතු කළයුතුය. නමුත් ඉහත තත්වයන් මෙම අරමුණ ඉටුකරගැනීමට බාධාවක්ව පැවැතුණි.

**(ඇ) කැනොපි මිලදී ගැනීම**

**-----------------------**

දෙපාර්තමේන්තුවේ කැබ් රථ සඳහා කැනොපි සවිකිරීම වෙනුවෙන් ලංසු කැඳවා තිබුණි. එම ලංසු කැඳවීමට පෙර ඒ සඳහා වන පිරිවිතරයන් පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කැබ් රථ 09 ක් සඳහා මාස 04 ක කාලසීමාවක් තුළ රු.113,200 ක සිට රු.253,680 ක් දක්වා මිල පරාසයක් මත පුද්ගලික ආයතනයකින් කැනොපි සවි කිරීම සඳහා එකතුව රු.මිලියන 1.9 ක් වැය කර තිබුණි.

**(ඈ) ගාල්ල හා පුත්තලම මිනින්දෝරු කාර්යාල ඉදිකිරීම**

**--------------------------------------------------------**

ගාල්ල හා පුත්තලම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ඉදිකිරීම සඳහා රු. මිලියන 29 ක් වැයකර තිබුණි. මෙම ඉදිකිරීමට අදාළව ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ලංසු කැඳවා ප්‍රසම්පාදනය ආරම්භ කර තිබුණි.

**(ඉ) ප්‍රසම්පාදන සැලැස්ම**

**---------------------**

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් වූ රු.මිලියන 34.6 ක් වටිනා භාණ්ඩ සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදනය කරගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.මිලියන 23 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි.

**3.9 පාඩු හා හානි**

**---------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි වර්ෂ 25 කට වඩා පැරණි වර්ග 09 කට අයිත් තීන්ත කිලෝ ග්‍රෑම් 222.5 හා Positive Remover බෝතල් 19 ක් හා Plate cleaner 45 ක් විනාශ වී තිබුණි. මේවායේ වටිනාකම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාහන අනතුරු දෙකකට අදාළව එකතුව රු.124,025 ක අලාභහානි කපාහැර ඇති බව විසර්ජන ගිණුමේ දක්වා තිබුණත්, ඒ සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) අනතුරුවලින් සිදු වූ අලාභයන් අයකර ගැනීම සඳහා නිසි කාලවකවානුවලදී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු හෙයින් වර්ෂ කිහිපයක සිට වාහන 12 කට සිදුවූ අලාභහානිවලින් රු.622,832 ක් පොතෙන් කපා හැරීමට සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පැවැතුණි.

## 3.10 අනාර්ථික ගනුදෙනු

--------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි වර්ෂ කිහිපයක අවශ්‍යතාවයන්ට සරිලන තොග 2015 ජනවාරි 01 දිනට ගබඩාවේ පැවතියද 2015 අගෝස්තු 25 දින ඒ පිළිබඳව සැලකිලිමත් නොවී රු.මිලියන 5.6 ක් වටිනා ලිතෝ කඩදාසි මිලදී ගෙන තිබුණි. මෙසේ මිලදී ගෙන තිබුණු සම්පූර්ණ තොගයම 2016 අගෝස්තු 31 දින වන විටත් ගබඩාවෙන් නිකුත් නොකර රඳවාගෙන පැවති අතර එම මිලදීගැනීම් දිනට පෙර මිලදී ගත් ලිතෝ කඩදාසි තොගයක්ද එදිනට ගබඩාවේ ඉතිරිව පැවතුණි.

## 3.11 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දිරි දීමනා ගෙවීමේදී මිනින්දෝරුවරයකු මාසිකව ඉටුකළ යුතු අවම වැඩ ප්‍රමාණය (Monthly Norms) තීරණය කර තිබුණද මසකට දිරි දීමනා ගෙවීමට අදාළ කරගත හැකි උපරිම කැබලි සංඛ්‍යාවක් හෝ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවිය හැකි සීමාවක් තීරණය කිරීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දිරි දීමනා හා අධීක්ෂණ ගාස්තු ගෙවා තිබුණි. ඒ අනුව දිරිදීමනා හා අධීක්ෂණ ගාස්තු වශයෙන් පමණක් ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුප මෙන් දෙගුණයක ප්‍රමාණය ඉක්මවන පරිදි ගෙවීම් කර තිබුණි.

(ආ) ඉතා දියුණු තාක්ෂණික උපකරණ මෙන්ම චන්ද්‍රිකා හා පරිගණක තාක්ෂණය උපයෝගී කර ගැනීම හේතුවෙන් මිනින්දෝරු වැඩවල කාර්යක්ෂමතාවය වැඩි වී තිබුණි. නමුත් එම තත්ත්වය නොසළකා වසර තිහකටත් වඩා පැරණි ක්‍රමවේද පදනම් කරගෙන මිනින්දෝරුවරයෙකු විසින් මසකට මැනිය යුතු අවම කැබලි සංඛ්‍යාව 30 කට සීමා කර තිබුණි. එම සීමාව යටතේ මැනුම් කටයුතු සිදුකිරීම පදනම් කරගෙන දිරිදීමනා ගෙවා තිබුණි.

(ඇ) ගබඩා භාණ්ඩ ඉල්ලුම් කිරීමේදී භාණ්ඩ භාරගත් පුද්ගලයාගේ නම හා තනතුර සටහන් කර නොතිබුණි. භාණ්ඩ භාරගත් බවට අත්සන් නොයෙදූ අවස්ථා පැවැති අතර සමහර බඩු ඉල්ලුම් පත්වල පිටපත් 03 ම ගබඩාවේ ගොණුකර තිබුණි.

(ඈ) පහසුවෙන් හා නොපමාව හරි වැරදි බැලිය හැකි පරිදි භාරයේ තිබෙන භාණ්ඩ සතුටුදායක ලෙස ගබඩා කර නොතිබුණි. තවද භාණ්ඩ නිකුත් කිරීමේදී FIFO ක්‍රමය අනුගමනය කර නොතිබීමෙන් 2007 වර්ෂයේ මිලදී ගත් රු. 69,000 ක් වටිනා Lazer printer cartridge 03 ක් කල් ඉකුත්වී තිබුණි.

**3.12** **මානව සම්පත් කළමනාකරණය**

**(අ)** **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,185 | 920 | 265 | - |
| (ii) | තෘතියික මට්ටම | 117 | 79 | 38 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,349 | 1,019 | 333 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,852 | 4,081 | 772 | 01 |
| | එකතුව | 7,503 | 6,099 | 1,408 | 04 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). බඳවාගෙන තිබුණු අතිරික්ත සේවකයින් 04 දෙනෙකු පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii). මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් 389 දෙනෙකු වෙනත් කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

| අනුයුක්ත කර තිබුණු කාර්යාලය | සංඛ්‍යාව |
|---|---|
| පළාත් කාර්යාල සඳහා | 19 |
| දිස්ත්‍රික් කාර්යාල සඳහා | 149 |
| දියතලාව | 157 |
| ප්‍රධාන කාර්යාල සඳහා | 64 |
| එකතුව | 389 |

(iii). ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු ලෙස අනුමත නොවූ තනතුරකට සේවකයෙකු බඳවාගෙන තිබුණි.

**(ආ)** **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **මුදාහැර තිබුණු කාල පරිච්ඡේදය** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරී | 01 | සීමා නිර්ණය කොමිෂන් සභාව | 2015.03.15 දින සිට 2020.03.14 දින දක්වා |
| රජයේ මිනින්දෝරුවරු | 22 | ඉඩම් කොමසාරිස් කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල, සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ආරක්ෂක අමාත්‍යාංශය සහ දුම්රිය දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත. | 2006, 2007, 2010, 2012, 2013, 2014, 2015 වර්ෂයන්වල සිට මේ දක්වා |
| මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් | 11 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 1988, 1989, 1998, 2003, 2006, 2008 වර්ෂයන්වල සිට මේ දක්වා |
| | 31 | දුම්රිය දෙපාර්තමේන්තුව | 1996, 1998, 2001, 2002 වර්ෂවල සිට මේ දක්වා |
| | 03 | යුධ හමුදා සේවය | 1996, 1997 වර්ෂවල සිට මේ දක්වා |